Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2019-10-30 |
|---|---|---|

පැමිණිලිකරු : කේ.ජී. ජයතිස්ස මයා,
අංක 427, නිවත්තකචේතිය පාර
අනුරාධපුර

වගඋත්තරකරු/වන් : යුධ හමුදාපති,
ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය,
තැ.පෙ.553
කොළඹ.

<u>පැමිණිලි අංකය : ***HRC/AP/76/2017(W)***</u>

ඉහත පැමිණිලිකරු විසින් 2017.02.08 දිනැතිව මෙම පැමිණිල්ල ඉදිරිපත් කරමින්, යුධ හමුදාවේ සේවය කරන ලද තමා 1981 වර්ෂයේ යුධ හමුදා විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 14(1) වගන්තියට අනුව සේවා පාරිතෝෂිතය සඳහා හිමිකම් ලබා විශ්‍රාම වැටුප් ලැබීමට අනුමතව විශ්‍රාම ගිය බවත්, නමුත් තමාව උසස් නිලධාරීන්ගේ අත්තෝමතික සහ ද්වේශ සහගත ක්‍රියා කලාපය මඟින් පළිගැනීමේ අදහසින් සේවා පාරිතෝෂිතය සහ විශ්‍රාම වැටුප් අහිමි කරමින් කටයුතු කිරීමෙන් සිය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවත්ය.

පැමිණිල්ලට අදාළව ඉදිරිපත් කර ඇති වැඩිදුර කරුණු දැක්වීම් වලට අනුව පැමිණිලිකරු 1996.03.11 වන දින කැඩෙට් නිලධාරියෙකු ලෙස බංග්ලාදේශයේදී මූලික පුහුණුව ලබා ශ්‍රී ලංකා යුධ හමුදාවේ නිත්‍ය බල සේනාවේ සේවයට බැඳුනු බවත්, එකී බල සේනාවේ වසර 10යි, මාස 09යි, දින 10ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබියදී යුධ හමුදාවේ අණ පරිදි විශ්‍රාම ගිය බවත් ප්‍රකාශ කර ඇත.

2000 වර්ෂයේදී මන්නාරම් ප්‍රදේශයේ රාජකාරී යෙදී සිටින විට එවකට සිටි උසස් නිලධාරීන්ගේ ඉවසිය නොහැකි තාඩන පීඩන හේතුවෙන් දින 30ක කාලයක් සේවයට වාර්තා කිරීමට නොහැකි වූ බවත්, පසුව සේවයට වාර්තා කළ පසු එකී දින 30 සේවයට නොපැමිණීමේ වරද සඳහා යුධ හමුදා නීතිය යටතේ තමාට අදාළ දඬුවම් ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

එකී දඬුවම් ලැබීමෙන් පසුවද 2002 වර්ෂයේදී කපිතාන් නිලයට උසස්වීම් ලබා 2003 වර්ෂයේදී විදේශ පාඨමාලාවලටද සහභාගී වෙමින් යථා පරිදි රාජකාරී කරමින් සිටි බවද 2005 වර්ෂයේ සිට වව්නියාව බල ප්‍රදේශයේ රාජකාරී කරමින් සිටින අතරතුර 2006 වර්ෂයේදී යුධ හමුදාපතිවරයාගේ නියෝගයකට අනුව දින 30ක් සේවයට නොපැමිණීම යන වරදට දඬුවම් ලබා සිටියදී සහ ඉන් පසුව කිසිදු යුධ හමුදා සේවයේදී සිදුවීමක් නොමැති අවස්ථාවකදී රොක්හවුස් කඳවුරේ මධ්‍යස්ථාන සේවා විධායකතුමාගේ අංක සන්නද්ධ/පා/12/A(303) හා 2006.05.23 දිනැති ලිපියෙන් යුධ හමුදා සේවයෙන් ඉල්ලා අස්වන ලෙසට පැමිණිලිකරුට දැනුම්දුන් බව ප්‍රකාශ කර ඇත.

එකී දැනුම්දීම අනුවත් අනුරාධපුර කලත්තෑව යුධ හමුදා කඳවුරේ අණදෙන නිලධාරීතුමාගේ අංක 3/ශ්‍රියාසසබ/පා/8/A(15) හා 2006.06.10 දිනැති ලිපියෙන් වසර 10ත් 12ත් අතර සේවා කාලය සම්පූර්ණ වී ඇති බැවින් පාරිතෝෂිත දීමනා සහිතව යුධ හමුදා සේවයෙන් ඉවත් වන ලෙසට කරනු ලැබූ දැන්වීම අනුවත්, යුධ නීතියට අවනත වී සේවයෙන් ඉල්ලා අස්වීමට ලිපි ඉදිරිපත් කරන ලද බවත් සඳහන් කර ඇත.

තවද, ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය මඟින් නිකුත් කරන ලද 2006.09.11 දිනැති ලිපියට අනුව 2006.12.31 දින සිට සේනා විධායක ගරු ජනාධිපතිතුමාගේ නිර්දේශය මත යුධ හමුදාපති විසින් තමාගේ විශ්‍රාම ගැන්වීම අනුමත කර තම නිලය කපිතාන් ලෙස ස්ථිර කර තිබූ බවද, ඒ අනුව එකී දැන්වීමට අනුව පාරිතෝෂිත දීමනා සහිතව විශ්‍රාම ගන්වා තිබූ බැවින් කපිතාන් නිලය රැගෙන 2007.01.01 දින යුධ හමුදා සේවයෙන් විශ්‍රාම ගත් බවද ප්‍රකාශ කර ඇත.

එසේ තිබියදී යුධ හමුදා මූලස්ථානය මඟින් නිකුත් කරන ලද අංක යුධ/සේවා/63/268(37) හා 2007.03.05 දිනැති ලිපියෙන් පැමිණිලිකරුව කපිතාන් නිලයෙන් අත්තනෝමතික ලෙස පහත දමා ලුතිනන් ලෙස පත් කර ඇති බවත්, පාරිතෝෂිත දීමනා අහිමි කර ඇති බවත්, බැඳුම්කර ගාස්තු ලෙස රු: 20,1710.40ක් ගෙවීමට දන්වා ඇති බවත් සඳහන් කර ඇත.

තවද, කිසිදු හේතුවක් නොමැතිව 2007 වර්ෂයේ සිට මේ දක්වා පැමිණිලිකරුව අපලේඛනය (Black List) කර ඇති බවත්, කිසිදු රැකියාවකට යානොහැකි වන ආකාරයට පැමිණිලිකරුගේ අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් යුධ හමුදා භාරයේ තබාගෙන සිටින බවත්, වැඩිදුරටත් සඳහන් කර ඇත.

පැමිණිල්ලේ කරුණු සනාථ කිරීම සඳහා, රොක් හවුස් කඳවුරේ මධ්‍යස්ථ සේනා විධායක විසින් නිකුත් කර ඇති 2006.05.23 දිනැති ලිපිය, කලත්තෑව යුධ හමුදා කඳවුරේ අණදෙන නිලදාරීගේ 2006.06.10 දිනැති ලිපිය, යුධ හමුදා මූලස්ථානය මඟින් නිකුත් කර ඇති 2006.09.11 දිනැති ලිපිය, වැටුප් හා ලේඛන අධ්‍යක්ෂකගේ 2007.01.29 දිනැති ලිපිය, යුධ හමුදා මූලස්ථානය මඟින් නිකුත් කර ඇති 2007.03.05

දිනැති ලිපිය. යුධ හමුදා මූලස්ථානය මගින් නිකුත් කර ඇති 2016.09.26 දිනැති ලිපිය. කලත්තෑව යුධ හමුදා කඳවුරේ අණදෙන නිලධාරිගේ 2012.03.04 දිනැති ලිපිය. යුධ හමුදා මූලස්ථානය නිකුත් කර ඇති 2017.01.26 දිනැති ලිපිය. පාණ්ඩිකුළම 03 වන විමර්ශන රෙජිමේන්තුවේ අණදෙන නිලධාරිගේ 2009.11.30 දිනැති ලිපිය යන ලේඛන පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-

වගඋත්තරකාර පාර්ශවය විසින් 2017.08.09 දිනැතිව ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කරමින් පැමිණිල්ලේ චෝදනා සම්බන්ධයෙන් පහත පරිදි පිළිතුරු සපයා ඇත.

1981 යුධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂිත ව්‍යවස්ථාව සංග්‍රහයේ විධිවිධාන අනුව අවුරුදු 10කට වැඩි සේවා කාලයක් සපුරා ඇති නිලධරියෙකු යුධ හමුදා සේවයෙන් ඉල්ලා විශ්‍රාම ගැනීමක් සිදුකරන්නේ නම් ඔහුගේ සේවා කාලය වෙනුවෙන් සේවා පාරිතෝෂිත මුදලක් සඳහා හිමිකමක් ඇති බවත්, නමුත් මෙම පැමිණිලිකරු යුධ හමුදා සේවයෙන් නොව අධිකාරියෙන් ඉල්ලා අස්වීමක් සිදුකර ඇති බැවින්ද එකී ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර 2008.02.08 දිනැති ගැසට් පත්‍රයේ පළකර ඇති බැවින්ද අධිකාරියෙන් ඉල්ලා අස්වූ නිලධාරියෙකු හට පාරිතෝෂිත මුදලක් හිමිකර දීම සඳහා ඉහත කී ව්‍යවස්ථා සංග්‍රහයට අනුව විධිවිධාන සලස්වා නොමැති හෙයින් පැමිණිලිකරුට පාරිතෝෂිත හා විශ්‍රාම වැටුප් ගෙවා නොමැති බව ප්‍රකාශ කර ඇත.

පැමිණිලිකරු එළඹ ඇති ගිවිසුම ප්‍රකාරව ඔහුගෙන් රජයට අයවිය යුතු මුදල් ප්‍රමාණය ගණනය කර ඇත්තේ ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව බැවින් බැඳුම්කර ගාස්තු අයකර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කළ නොහැකි බවත්, බැඳුම්කර මුදල් ගෙවා අවසන් කළ පසු ඔහු යුධ හමුදාවට ලබා දී ඇති සහතික මුද්‍රාහැරිය හැකි බවත් සඳහන් කර ඇත.

නිරීක්ෂණ :-

01. ඉදිරිපත් වන කරුණුවලට අනුව 2006.04.05 වන දින යුධ හමුදා ලේකම් හා යුධ හමුදා මධ්‍යස්ථාන සේවා විධායකවරුන් අතර පැවති සාකච්ඡාවකදී ගන්නා ලද ප්‍රතිපත්ති තීන්දුවක් මත දින 21කට වඩා වැඩි කාලයක් නොදන්වා සේවයට නොපැමිණි අයවලුන් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග පිළිබඳව තීන්දුවක් ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

02. මෙම පැමිණිලිකරු 2000 වර්ෂයේදී දින 30ක කාලයක් සේවයට නොපැමිණීම හේතුවෙන් යුධ හමුදා නීතියට අනුව එම ආසන්න කාල සීමාවේදීම දඬුවම් ලබා ඇති බව පෙනී යන අතර, එකී දඬුවම් ලැබීමෙන් පසු ද කපිතාන් නිලයට 2002 වර්ෂයේ උසස්වීම් ලබා ඇති බව නිරීක්ෂණය වේ.

03. ඉහත සඳහන් කරන ලද ප්‍රතිපත්ති තීන්දුවට අනුව දින 21කට වඩා වැඩි කාලයක් නොදන්වා සේවයට වාර්තා නොකළ අය කාණ්ඩ 03ක් යටතේ යුධ හමුදා සේවයෙන් අස්කිරීමට හා විශ්‍රාම ගැන්වීමට තීන්දු කර ඇති අතර ඒ අනුව මෙම නිලධාරියා 2006.05.23 දිනැති ලිපියෙන් සඳහන් "ආ" කාණ්ඩය එනම්, සේවා කාලය වසර 10ත් 12ත් අතර වන්නේ නම් පාරිතෝෂිත සහිතව යුධ හමුදාවෙන් අස්කිරීම යන කාණ්ඩයට අයත් බව නිරීක්ෂණය වේ.

04. ඉහත සඳහන් කරන ලද ප්‍රතිපත්තිමය තීන්දුව ක්‍රියාවට නංවමින් එකී නිලධාරියා සේවය කරන ලද රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී විසින් 2006.06.10 දිනැති ලිපිය මඟින් යුධ හමුදා සේවයෙන් ඉල්ලා අස්වීම සිදුකරන ලෙස නිලධාරියාට ලිඛිතව දැනුම්දී ඇති බව නිරීක්ෂණය වේ.

05. නිලධාරියා විසින් 2006.06.10 දිනැතිව ඉදිරිපත් කරන ලද ඉල්ලා අස්වීමේ ලිපිය සලකා යුධ හමුදා මූලස්ථානය මඟින් 2006.09.11 වන දින නිකුත් කරන ලද ලිපිය මඟින් ඔහුගේ විශ්‍රාම ගැන්වීම පිළිගෙන ඇති අතර, විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ස්ථිර නිලය වශයෙන් කපිතාන් නිලය සඳහන් කර ඇත. ඒ සම්බන්ධයෙන් නිලධාරියා සේවය කරන ලද ඒකකය මඟින්ද නිලධාරියාව දැනුවත් කර ඇති අතර, වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.01.29 දිනැතිව නිකුත් කරන ලද ලිපිය මඟින්ද මෙම නිලධාරියා විශ්‍රාමික නිලධාරියෙකු ලෙස පිළිගෙන කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

06. එසේ වුවද 2007.03.05 දින යුධ හමුදා මූලස්ථානය මඟින් නිකුත් කරන ලද ලිපිය මඟින් මෙම නිලධාරියා 2006.12.31 වන දින අධිකාරියෙන් ඉල්ලා අස්වීම හේතු කොට ගෙන සේවයෙන් ඉවත් කරන බව දන්වා ඇත. එපමණක් නොව එම නිලධාරියා යුධ හමුදාවට බැඳීමේදී ඇති කර ගන්නා ලද ගිවිසුම් ප්‍රකාරව රජයට රුː 29,8955.19ක මුදලක් ගෙවන ලෙසද ලිපි කීපයක් මඟින් එම නිලධාරී වෙත දැනුම් දී ඇති බවද නිරීක්ෂණය වේ.

නිගමනය ː-

මෙම පැමිණිල්ලට අදාළ පරීක්ෂණයේදී පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති මූලික කාරණා 03ක් පිළිබඳව විශේෂ අවධානය යොමු කර ඇත.

01. නිලධාරියා විශ්‍රාම පාරිතෝෂිත සහිතව විශ්‍රාම ගැන්වීමක් සිදුකළ යුතුව තිබියදී ශ්‍රී ලංකා යුධ හමුදාවේ නිත්‍ය බල සේනාවෙන් ඉවත් කිරීමට කටයුතු කිරීම

02. සාධාරණ හේතුවකින් තොරව පැමිණිලිකරුගේ අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් පැමිණිලිකරු වෙත ලබා නොදී රඳවා ගෙන තබා ගැනීම

03. ඔප්පු කළ හැකි සාධක නොමැතිව පැමිණිලිකරුගේ නම අපලේඛනය (*Black List*) කර ඇති බවට ඉදිරිපත් කර ඇති කරුණු.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මඟින් නීතියේ සමාන රැකවරණය ලබා ගැනීමේ අයිතිය ලබා දී ඇති අතර, නීතිය ක්‍රියාත්මක වීමේදී සර්ව සාධාරණ විය යුතු බව එමඟින් පෙන්වා දී ඇත. එකී මූලික අයිතිවාසිකම ආරක්‍ෂා වීම තහවුරු කිරීම උදෙසා සියලුම විධායක හා පරිපාලන ක්‍රියාවක් සිදුකිරීමේදී නිශ්චිත ක්‍රමවේදයකට අනුව සිදුකිරීම හඳුන්වා දී ඇත. ඒ අනුව රාජ්‍ය ආයතන මඟින් විධායක හා පරිපාලන ක්‍රියාවක් සිදුකිරීමේදී ඉහත කී මූලික අයිතිවාසිකම් ආරක්‍ෂා වන ආකාරයට සකස් කරන ලද කාර්ය පටිපාටීන් (*Administrative Proceedures*) අනුගමනය කළයුතු වේ.

ඉහත සඳහන් කරන ලද පළමු කාරණය පිළිබඳව අවධානය යොමු කිරීමේදී යුධ හමුදාව විසින් 2006.05.23 දින නිකුත් කර ඇති චක්‍රලේඛනයට අනුව පැමිණිලිකාර නිලධාරියාගේ විශ්‍රාම ගැන්වීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, 2006.05.23 දිනැති ලිපියෙන් "ආ" කාණ්ඩය යටතේ එකී නිලධාරියා විශ්‍රාම ගැන්වීමේ කටයුතු අඛණ්ඩව සිදුවී ඇත. කෙසේ වෙතත් අදාළ කටයුතු සිදුවන අතරතුර මෙම නිලධාරියා අධිකාරියෙන් ඉල්ලා අස්වූ නිලධාරියෙකු ලෙස සලකා කටයුතු කිරීම ආරම්භ කර ඇති බව පෙනී යයි.

ඒ සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවයේ පිළිතුර වී ඇත්තේ 2006.04.05 දින ගන්නා ලද ප්‍රතිපත්තිමය තීන්දුව අනුව නිකුත් කර ඇති 2006.05.23 දිනැති ලිපිය අනුව මෙම නිලධාරියා යුධ හමුදා සේවයෙන් ඉවත්වීම සඳහා ඉල්ලීම් කළ යුතුව තිබුන නමුත් එම නිලධාරියා විසින් ශ්‍රී ලංකා යුධ හමුදාවේ නිත්‍ය බල සේනාවෙන් ඉවත් වීමට ඉල්ලීම් කර ඇති නිසා අධිකාරියෙන් ඉල්ලා අස්වූ නිලධාරියෙකු ලෙස සලකා පසුව කටයුතු කර ඇති බවයි. 2006.05.23 නිකුත් කරන ලද ලිපියට අනුව නිලධාරියාව සේවයෙන් ඉවත් කර විශ්‍රාම පාරිතෝෂිත සහිතව සේවයෙන් ඉවත් කිරීමේ කටයුතු 2006.12.31 වන දින දක්වා අඛණ්ඩව සිදුකර තිබියදී එය අධිකාරියෙන් ඉල්ලා අස්වීම සේ සලකා විශ්‍රාම පාරිතෝෂිත අහිමි කර ඇත්තේ, නිලධාරියාගේ ඉල්ලා අස්වීමේ ලිපියේ ඇති තාක්‍ෂණික දෝෂයක් නිසා බව පෙනී යයි.

යම් කිසි නිශ්චිත කාර්ය පටිපාටියන් අනුගමනය කරමින් සිටියදී නිලධාරියා ඉදිරිපත් කරන ලද ලිපියෙහි ඇති තාක්‍ෂණික දෝෂය නිවැරදි කරනවා වෙනුවට එම කරුණු වෙනත් ආකාරයකට අර්ථ නිරූපණය කර නිලධාරියාගේ විශ්‍රාම පාරිතෝෂිත අහිමි කිරීමත් ඔහුගේ නිලය පහළ දැමීමත් යුක්ති සහගත නොවන බව කොමිෂන් සභාවේ නිගමනයයි.

ඉහතින් සඳහන් කරන ලද දෙවන කාරණය පිළිබඳ අවධානය යොමු කිරීමේදී පැමිණිලිකරුගේ අධ්‍යාපන සහතිකලවල මුල් පිටපත් ඔහු වෙත ලබානොදී රඳවා තබා ගැනීමට හේතුව ලෙස

වගඋත්තරකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත්තේ, යුධ හමුදාවට ගෙවිය යුතු මුදල ගෙවන තෙක් ඔහුගේ සහතික රඳවා ගෙන ඇති බවයි. එසේ වුවද ඒ ආකාරයට යුධ හමුදාවට ගෙවීමට ඇති මුදල් ගෙවන තෙක් සහතික රඳවා තබා ගත හැක්කේ කුමන නෛතික විධිවිධාන යටතේද යන්න වගඋත්තරකාර පාර්ශවය පැහැදිලි කර නැත. මුදලක් අයවීමට තිබේ නම් එකී මුදල අයකර ගැනීම සඳහා ඊට අදාළව පවතින නීතිය ක්‍රියාත්මක කර මුදල අයකර ගැනීමට කටයුතු කළයුතු අතර, ඒ වෙනුවට යම් කෙනෙකුගේ පෞද්ගලික අධ්‍යාපන සහතික වැනි ලේඛන රඳවා තබා ගැනීම නීත්‍යානුකූල නොවේ.

තවද, මෙම නිලධාරියා අපලේඛනය (*Black List*) කර තිබේද යන්න පිළිබඳව වගඋත්තරකාර පාර්ශවය තහවුරු කර නොමැත. ඒ පිළිබඳව සොයා බලා කොමිෂන් සභාවට කරුණු වාර්තා කරන බව වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කර ඇතත්, අදාළ තොරතුරු වාර්තා කිරීමට කටයුතු කර නැත. ඒ අනුව අපලේඛනය කිරීමක් කර තිබේ නම් ඒ සඳහා හේතු මොනවාද යන්න පැහැදිලි කරදීමක් සිදුකර නොමැති බව නිරීක්ෂණය වේ.

මෙකී සමස්ථ කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී, වගඋත්තර පාර්ශවීය ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති "නීතිය පසිඳලීම සහ නීතිය ක්‍රියාත්මක කිරීමද නීතියේ රැකවරණයද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. යුධ සේවා ලේකම් හා මධ්‍යස්ථාන සේවා විධායකවරුන් අතර 2006.04.05 දිනැතිව පැවති සාකච්ඡාවේදී ගන්නා ලද ප්‍රතිපත්ති තීන්දුව මත නිකුත් කරන ලද 2006.05.23 දිනැති ලිපියේ "ඇ" කාණ්ඩය යටතේ පැමිණිලිකරුව පාරිතෝෂිත දීමනා සහිතව යුධ හමුදාවෙන් අස්කිරීම සිදුකිරීමට වගඋත්තරකාර පාර්ශවය විසින් කටයුතු කළ යතුව ඇත.

02. එසේම පැමිණිලිකරුගේ අධ්‍යාපන සහතික වල මුල් පිටපත් ඔහු වෙත මුදා හැරීමට කටයුතු කළ යුතු බවටද වගඋත්තකාර පාර්ශවය වෙත දන්වා සිටිනු ලැබේ.

03. සාධාරණ හේතුවකින් තොරව පැමිණිලිකරුව අපලේඛනය (*Black List*) කිරීමක් සිදුකර තිබේනම් ඒ පිළිබඳව සොයා බලා එය නිවැරදි කිරීමට කටයුතු කරන ලෙසද වගඋත්තර පාර්ශවය වෙත දන්වා සිටිනු ලැබේ.

2019. 11 · 29 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මාන හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04

කොමසාරිස්,
ශ්‍රී ලංකා මාන හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත් :- 01. ගරු අමාත්‍යතුමා,
ආරක්ෂක අමාත්‍යාංශය
කොළඹ

02. ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය,
අංක 15/05, බාලදක්ෂ මාවත,
කොළඹ

B/